SJSW 2025 9(2): 144-165

Sri Lanka Journal of Social Work (SJSW)
Volume 09 – Issue 02

11

# STRENGTHENING PSYCHOSOCIAL INTERVENTIONS FOR SEXUALLY ABUSED FEMALE CHILDREN IN ALTERNATIVE CARE IN SRI LANKA

## ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණයේ සිටින ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු ළමයින් සඳහා මනෝ-සමාජීය මැදිහත්වීම් ශක්තිමත් කිරීම

**Karunarathna, B.K.S**
National Institute of Social Development, Lianagemulla, Seeduwa, Sri Lanka
Email: bkskarunarathna@gmail.com

**සංක්ෂේපය**

*විවිධාකාරයේ හිංසනයන්ට හා අපයෝජනයන්ට නූතනයේදී ළමුන් ගොදුරු වන අතර ඉන් වඩාත් බරපතලම අපයෝජනය වන්නේ ලිංගික අපයෝජනයයි. ලිංගික අපයෝජනය සඳහා ගොදුරු වන ළමුන් අතරින් ගැහැණු ළමුන් සුවිශේෂී වේ. ගැහැණු ළමුන්ගේ සංවර්ධනයට එමගින් වන බලපෑම ප්‍රබලය. ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වන ළමුන්ගේ රැකවරණය සඳහා ඔවුන් විකල්ප රැකවරණයන්ට යොමුකිරීම නූතනයේදී සුලභව හඳුනාගත හැකිය. එහිදී ප්‍රජාපාදක විකල්ප රැකවරණය මෙන්ම ආයතනගත රැකවරණයද ජනප්‍රිය වී තිබේ. මෙම පර්යේෂණ ලිපිය මගින් උත්සාහ කරනු ලබන්නේ ලිංගික අපයෝජනයේ වින්දිතයින් බවට පත් වී ප්‍රජා පාදක විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කිරීමයි. ලිංගික අපයෝජනයට ලක්ව සිටින ගැහැණු ළමුන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී මනෝ සමාජීය අවශ්‍යතාවයන් කොතෙක් දුරට සැපිරී ඇත්දැයි යන්න පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. ඒ අනුව මනෝ සමාජීය මැදිහත්කරණයක් මගින් වින්දිත ළමුන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍ය සාධනීය පරිසරයක් සැකසීමට හැකියාව තිබේ. එබැවින් ශ්‍රී ලංකාව තුළ ලිංගික අපයෝජනයේ ගොදුරු බවට පත් වී ප්‍රජා පාදක විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා ක්‍රියාකිරීමේදී මනෝ සමාජීය මැදිහත්කරණය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සොයා බැලීමට මෙම පර්යේෂණය මගින් අවස්ථාව ලැබේ. ගුණාත්මක පර්යේෂණයක් වන මෙම පර්යේෂණය සඳහා නියැදිය ලෙස යොදාගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ ළමාරක්ෂණය සඳහා කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය ආයතනයක් වන පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ප්‍රජාපාදක විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ය. ලිංගික අපයෝජනයට ගොදුරුවීමෙන් අනතුරුව අධිකරණ නියෝග මත විකල්ප රැකවරණය සඳහා යොමු කොට ඇති මෙම ගැහැණු ළමුන්ගෙන් දත්ත රැස්කර ගැනීමේදී සිද්ධි අධ්‍යයන විධික්‍රමය ඒ සඳහා යොදාගත් අතර ඔවුන් අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් සමඟ පවත්වන ලද නියමු සම්මුඛ සාකච්ඡා මගින්ද පර්යේෂණයට අවශ්‍ය මූලික දත්ත රැස්කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා තේමා විශ්ලේෂණය භාවිතා කොට ඇත. පර්යේෂණයේ මූලික සොයා ගැනීම් අනුව ලිංගික අපයෝජනයට ලක් වී විකල්ප රැකවරණයේ පසු වන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා මනෝ සමාජීය මැදිහත්කරණය පිළිබඳව සැලකිලිමත්වීම අත්‍යාවශ්‍ය වේ. එහිදී ආදරය, සෙනෙහස, කරුණාව හා දයාව, පිළිගැනීම, වීවේකය හා විනෝදාශ්වාදය, ආත්ම අභිමානය,*

*සමපදස්ථ ඇසුර, සමාජ ක්‍රියාකාරකම් වැනි මනෝ සමාජීය අවශ්‍යතා රාශියක් මොවුන්ට අහිමි වී තිබෙන බැවින් ඒ සඳහා පරිවාස කාර්යාල මට්ටමින් මනෝ උපදේශන සේවාවන් ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය බව මෙහිදී හඳුනාගෙන ඇත.*

***මුඛ්‍ය පදඃ*** *ළමා ලිංගික අපයෝජනය, ළමා අයිතිවාසිකම්, උපරිම යහපත, විකල්ප රැකවරණය, මනෝ සමාජීය මැදිහත්කරණය*

## ABSTRACT

*In contemporary society, children are exposed to various forms of violence and abuse, among which sexual abuse remains one of the most severe and devastating. Female children, in particular, are disproportionately affected by sexual abuse, which profoundly impacts their physical, psychological, and social development. In Sri Lanka, many such victims are placed in alternative care settings both community-based and institutional for their care and protection.*

*This study seeks to examine the importance of safeguarding the rights and promoting the overall well-being of sexually abused female children living in community-based alternative care. It specifically focuses on the extent to which their psycho-social needs are addressed within these care settings. Psycho-social interventions play a crucial role in creating a supportive environment conducive to the holistic recovery and well-being of these children. Accordingly, this research explores the necessity of strengthening psycho-social interventions to enhance the quality of care and the optimal development of sexually abused female children residing in community-based alternative care in Sri Lanka.*

*Adopting a qualitative research design, the study was conducted among female children under the supervision of the Department of Probation and Child Care Services, the primary state institution responsible for child protection in Sri Lanka. Data were collected through case studies and in-depth interviews with probation officers overseeing the children. Thematic analysis was employed to interpret the data.*

*Findings reveal that ensuring the psycho-social well-being of sexually abused female children in alternative care requires deliberate and sustained attention. Many of these children experience deprivation of essential psycho-social needs such as love, affection, empathy, acceptance, relaxation, recreation, self-esteem, balanced relationships, and social participation. The study underscores the urgent need to strengthen psycho-social counseling and support services at the probation office level to ensure these children's optimal well-being and reintegration into society.*

**KEYWORDS:** *Child sexual abuse, Child rights, Well-being, Alternative care, Psycho-social intervention*

## 1. හැඳින්වීම

වර්තමාන ලෝකයේ බොහෝ රටවල ළමයින්ට මුහුණදීමට සිදු වී ඇති ප්‍රමුඛ සමාජ ප්‍රශ්නයක් ලෙස ලිංගික අපයෝජනය හඳුන්වා දිය හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානය (1999) ළමා ලිංගික අපයෝජනය නිර්වචනය කරන්නේ ළමයෙකු සම්පූර්ණයෙන් වටහා නොගත්, දැනුවත් අවසරයක් ලබා දීමට නොහැකි වූ හෝ දරුවා වර්ධනයට සූදානම් නැති ලිංගික ක්‍රියාකාරකම්වල යෙදී සිටීමයි. ළමා ලිංගික අපයෝජනය ළමයෙකුගේ වර්ධනයට සහ සංවර්ධනයට බාධා කරන අතර ජීවිත කාලය පුරාවට නොයෙකුත් විකෘති සෞඛ්‍ය හැසිරීම් සහ දුර්වල සමාජ, මානසික සහ කායික සෞඛ්‍ය ප්‍රතිඵලවලට ද හේතුවක් වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දී තිබේ.
ළමා ලිංගික අපයෝජනය ළමයින්ට එරෙහිව සිදුවන බරපතල අපරාධයකි. මෙයට වඩා ලොකු වැඩිහිටියකු ඔහුගේ බලය, ශක්තිය නැතහොත් ළමයා ඔහු කෙරෙහි තබා ඇති ගෞරවය හා විශ්වාසය උපයෝගී කරගෙන ළමයකු ලිංගික කාර්යයන් සඳහා යොදාගැනීම ලිංගික අපයෝජනය ලෙස හැඳින්විය හැකිය. (වන්නිආරච්චි 2008 : 154) මෙහිදී ළමයා පොළඹවාගැනීමට මිල මුදල්, රස කැවිලි වැනි කෑම බීම, ඇඳුම් පැළඳුම් ආදිය දීම වැනි විවිධ උපක්‍රම භාවිතයට ගැනීමට සිදුවෙයි. කෙසේ වුවද මේ යටතේ බොහෝ දුරට සාකච්ඡාවට ලක් කරනුයේ ලිංගික අභිමතාර්ථයක් සහිතව කායික හෝ මානසික වශයෙන් පරිපූර්ණත්වයට පත් නොවූ එසේම වැඩිහිටිභාවයට පත් නොවූ ළමයින් සමඟ පවත්වන්නා වූ ලිංගික ක්‍රියාකාරකම් හා බැඳුණු ක්‍රියාකාරකම් සඳහා ළමුන් යොදවා ගැනීමයි.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව සියලු ආකාරයේ නොසැලකිල්ල, සූරාකෑම හෝ අපයෝජනය, වදහිංසා හෝ වෙනත් ආකාරයේ කෲර, අමානුෂික, අවමන් සහගත සැලකීමකට හෝ දඬුවමකට නැතහොත් සන්නද්ධ අරගලයකට භාජන වූ ළමා වින්දිතයන්, කායික හා මානසික වශයෙන් යළි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සහ සමාජගත කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම රජයක් විසින් භාර ගත යුතු බව නියම කර ඇති අතර, පවුල් පරිසරයක් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්ම අහිමි වූ දරුවන්ට විකල්ප රැකවරණ සෙවීම වෙනත් ක්‍රමයක් කිසිසේත් නොමැති නිසා ගන්නා අවසාන විසඳුම ලෙස සැලකිය යුතු බවත්, දරුවන් සිය පවුල් පරිසරය තුළ රඳවා තැබීමට හා ආයතනගත කළ ද ආපසු භාර දීම සඳහා සියලු උත්සාහයන් දැරිය යුතු බවත් අවධාරණය කරමින්, රාජ්‍ය හා ස්වේච්ඡා අංශයන්හි ආයතනවල පවුල් පරිසරය අහිමි වූ දරුවන්ට විකල්ප රැකවරණය සපයන සියලු සත්කාරක සේවා සපයන්නන් තමා භාරයේ සිටින දරුවන් පවුලට හා ප්‍රජාවට යළි අන්තර්කරණය කිරීමේ පරම පරමාර්ථයෙන් ඔවුන්ගේ කායික හා මානසික තත්ත්වයන් යළි ප්‍රකෘතිමත් කිරීම සහතික කරමින් පූර්ණ සුසංගත වර්ධනයට දායක වීමට ඇප කැපවිය යුතුය.

ළමා රැකවරණය යනු දරුවකුගේ ආරක්ෂාව හා සුභසාධනය රැකගැනීමයි.(ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය, 2019) ළමා රැකවරණය නූතන සමාජයට අත්‍යාවශ්‍ය වී තිබේ. ළමුන්ගේ උපරිම යහපත ඇති කිරීම ළමා රැකවරණයේ පරමාර්ථය වන හෙයින් ඒ සඳහා හැකි සෑම උත්සාහයක්ම ගැනීමට වග බලා ගත යුතුය. ළමා රැකවරණයේදී මූලිකව වැදගත් වන්නේ ළමයා ජීවත්වන පවුල හා සමාජයයි. ස්වකීය දෙමව්පියන්ගේ පවුල් පරිසරයෙන් පරිබාහිරව අධිකරණ නියෝගයකින් හෝ එවැනි බලයක් සහිත ආයතනයක් මගින් දෙනු ලැබූ තීරණයක් මත දරුවන් විකල්ප ළමාරැකවරණයට යොමු කිරීම නූතනයේදී හඳුනාගත හැකි අතර ඒ අතරින් ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන් සුවිශේෂී වේ.
.

ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී මෙම අයිතිවාසිකම් පදනම් කර ගත් සමාජ වැඩ ප්‍රවේශය මගින් ඵලදායි ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ ලිංගික අපයෝජනයට ලක්වූ දරුවන් බහුතරයක් වර්තමානය වන

විට විකල්ප රැකවරණය යටතේ පසුව අතර ඔවුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී මනෝ සමාජීය මැදිහත්කරණය කෙසේ උපයෝගී කරගත හැකිදැයි සොයා බැලීමේ මූලික පරමාර්ථය සහිතව මෙම පර්යේෂණය සිදු කරනු ලැබීය.

ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්පය රැකවරණය යටතේ පසුවන ගැහැණු දරුවන් සමාජය තුළ නොයෙකුත් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට ලක් වන බව පැහැදිලිව දක්නට ඇතත් ඒ පිළිබඳව ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සිදුකිරීමට පර්යේෂකයින් උනන්දු වී ඇත්තේ අල්ප වශයෙනි. එයට හේතුව විකල්ප රැකවරණයේ පසුවන බොහෝ ගැහැණු ළමුන් අධිකරණ නියෝග යටතේ පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පසුවීම හා එම නිලධාරීන් අධිකරණයේ විභාගවෙමින් පවතින නඩුවල තොරතුරු බාහිර පුද්ගලයින් වෙත ලබාදීමට ක්‍රියා නොකිරීමයි. ආයතනගත ළමුන් පිළිබඳව තොරතුරු ලබාදීමට කටයුතු කළද විකල්ප රැකවරණය යටතේ පසුවන ළමුන්ගේ තොරතුරු ලබාදීමට බොහෝදුරට ක්‍රියා නොකිරීම හේතුවෙන් මේ පිළිබඳව පර්යේෂණ අවම මට්ටමක පවතින බව පෙනේ. ලිංගික අපයෝජනයට ලක් වන ගැහැණු දරුවන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී අභියෝග රාශියක් නූතන සමාජ සන්දර්භය තුළ හඳුනාගත හැකිය විශේෂයෙන්ම ඔවුන්ට හිමි ළමා අයිතිවාසිකම් විශාල වශයෙන් උල්ලංඝනය වන බව පැහැදිලිවම හඳුනාගත හැකි කාරණයකි. එබැවින් ඔවුන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් හා රාජ්‍ය නොවන අංශවල සියලු දෙනාගේ ඵලදායි මැදිහත්කරණය අත්‍යවශ්‍ය වී ඇත ඒ සඳහා 1989 වර්ෂයේ සම්මත කරන ලද ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මාර්ගෝපදේශ සපයයි. එම ප්‍රඥප්තිය තුළ ළමුන්ට හිමි අයිතිවාසිකම් ලිංගික අපයෝජන ලක්වූ දරුවන්ට ද ඒ හා සමානව භුක්ති විඳීමේ අයිතිය රජය විසින් තහවුරු කර දීමට බැඳී සිටී. මෙම පර්යේෂණය තුළදී පර්යේෂකයා අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය ලිංගික අපයෝජනයට ලක් වී විකල්ප ළමා රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කොතෙක් දුරට කටයුතු කරන්නේද යන්න හා ඒ සඳහා මනෝ සමාජීය මැදිහත්කරණයේ අවශ්‍යතාවය පරීක්ෂාකර බැලීමයි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ විකල්ප ළමා රැකවරණය සඳහා යොමු කරනු ලැබූ ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු දරුවන් විශාල ප්‍රමාණයක් හඳුනාගත හැකිය. ඔවුන් බහුතරයකගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සුලභව සිදු වුවද ඒවා වාර්තාවීම බොහෝදුරට අවම මට්ටමින් සිදුවේ. ඔවුන්ගේ උපරිම යහපත සැලසීම සඳහා මනෝ විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක මැදිහත්වීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම මගින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කළ හැකිය. එබැවින් මෙම පර්යේෂණය මගින් උත්සාහ දරනු ලබන්නේ ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වී දැනට විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සිදු වන ආකාරය හඳුනාගැනීම හා ඔවුන්ගේ උපරිම යහපත සඳහා මනෝ සමාජීය මැදිහත්කරණයේ අවශ්‍යතාවය පිළිබඳව සොයා බැලීමයි.

මෙම පර්යේෂණය කාලීන වශයෙන් ඉතා වැදගත් පර්යේෂණයක් වන්නේ අන්තර්ජාතික වශයෙන් විකල්ප රැකවරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති පසුබිමක, ශ්‍රී ලංකාවද විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්මත කරගනිමින්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා රජය යොමු වී තිබීමයි. ඒ අනුව වර්තමානයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ සිටින ගැහැණු ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීම කෙසේ සිදුවන්නේදැයි හඳුනාගැනීමට මෙහිදී හැකියාව ලැබේ. විශේෂයෙන්ම ළමා ලිංගික අපයෝජනයට ලක් වූ ගැහැණු ළමුන් අනෙකුත් ළමා අපයෝජනයන්ට ගොදුරු වූ ළමුන්ට සාපේක්ෂව විවිධාකාර වූ අයිතිවාසිකම් උල්ලංඝනයන්ට වැඩි වශයෙන් ලක් වන බවට වන මතවාදයන් හි සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කර බැලීම හා ලිංගික අපයෝජනයට ගොදුරුවීම හේතුවෙන් ආයතනගත රැකවරණයට යොමුවන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව තවදුරටත් අවම කරමින්, අයිතිවාසිකම් පදනම් කරගත් සමාජ වැඩ ප්‍රවේශය ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රවර්ධනයට දායකත්වය සැපයීම අරමුණු කරගනිමින් මෙම පර්යේෂණය සිදු කිරීම හේතුවෙන් කාලීන වශයෙන් මෙය ඉතාවැදගත් පර්යේෂණයකි.

ළමා ලිංගික අපයෝජනය වඩාත් බරපතල ලෙස බලපානු ලබන්නේ ගැහැණු දරුවන් කෙරෙහිය. ළමා ලිංගික අපයෝජනයට ගොදුරු වන ගැහැණු ළමුන් ඒ හේතුවෙන් ලබන කටුක අමිහිරි අත්දැකීම් පසුකාලීනව ඔවුන්ගේ ජීවිත කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි. ළමා ලිංගික අපයෝජනයට ලක්වන ළමුන් සඳහා ආයතන ගත ළමා රැකවරණය මෙන්ම විකල්ප ළමා රැකවරණය ද නූතන ලෝකයේ භාවිතා වේ. මින් වඩාත් වැදගත් වන්නේ විකල්ප ළමා රැකවරණයයි. විකල්ප ළමා රැකවරණය යටතේ ළමයින් තමන්ගේ පවුල් පරිසරය හා ප්‍රජාව තුළ සිටියදීම සංවර්ධනය කිරීම සඳහා උත්සහ ගනී. විකල්ප ළමා රැකවරණයේ තීරණාත්මක සාධකය ළමයා ජීවත්වන පවුල හා ප්‍රජාවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය (2010) හඳුන්වා දෙන ලද විකල්ප මාර්ගෝපදේශ මාලාවේ සඳහන් වන පරිදි ළමයෙකු තම නේවාසික පරිසරයෙන් ඉවත් කොට ආයතන ගතකිරීම සිදු කරන්නේ නම් එය අවසන් විකල්පය වශයෙන් කළයුතු බවයි. එසේ ආයතනගත කළද එය ඉතාමත් කෙටිකාලීනව සිදුකොට ළමයා නැවත පවුල හෝ ප්‍රජාව වෙතට යොමු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බව එහි සඳහන් වේ. එක්සත්ජාතීන්ගේ සංවිධානය හදුන්වාදුන් මාර්ගෝපදේශ අනුව ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019) දී සම්පාදනය කර ඇති අතර එහි සඳහන් පරිදි විකල්ප රැකවරණය යනු, "අධිකරණය හෝ එවැනි බලයක් ලබා දී ඇති ආයතනයක් මගින් දෙනු ලැබූ තීරණයක් මත හෝ දරුවා ගේ, දෙමාපියන්/ භාරකරුවන් ගේ හෝ දෙමාපියන් නොමැති අවස්ථාවක රැකවරණ සපයන්නෙකු ගේ මූලික වීමෙන්, දෙමාපිය සෙවනින් පරිබාහිරව දරුවකුහට විධිමත් හෝ අවිධිමත් රැකවරණ සැලසීමක් වේ". ඒ අනුව 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණයට යොමු කොට ඇති ළමුන් සංඛ්‍යාව පහත පරිදි හඳුනාගත හැකිය.

## 2. පර්යේෂණ ගැටලුව

ළමුන්ගේ උපරිම යහපත පිළිබඳව විශේෂ අවධානයක් 1989 වර්ෂයේදී සම්මත කරනලද එක්සත්ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ තුන්වන වගන්තිය මගින් දක්වේ. එය ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ ප්‍රධාන මූලධර්මයකි. එහි දක්වෙන පරිදි ළමුන් පිළිබඳ සියලුම ක්‍රියාවන්හිදී, පොදු හෝ පෞද්ගලික සමාජ සුභසාධන ආයතන, අධිකරණ, පරිපාලන අධිකාරයන්, ව්‍යවස්ථාදායක මණ්ඩල වැනි සියලු ආයතන ළමයාගේ උපරිම යහපත පළමු පිළිගැනීම ලෙස සලකා කටයුතු කළ යුතුය. එහෙත් ශ්‍රී ලංකාවේ ලිංගික අපයෝජනයට ගොදුරුවන ළමුන් සම්බන්ධයෙන් සැලකීමේදී ඔවුන්ගේ උපරිම යහපත සැලසෙන්නේද යන්න ගැටලු සහගතය. ආයතනගත ළමුන් පිළිබඳව මෙතෙක් සිදුකර ඇති බොහෝ අධ්‍යයන මගින් හෙළිදරවු වී ඇත්තේ එම ළමුන් නැවත සමාජගත කිරීම මගින් ඔවුන්ගේ උපරිම යහපත සැලසිය හැකි බවයි. ඒ අනුව මෙවැනි ළමුන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී විකල්ප රැකවරණය පිළිබඳව වැඩි අවධානයක් මෑතකදී යොමු වී ඇති අතර එම විකල්ප රැකවරණයේ පසු වන ළමුන් විවිධාකාර වූ ගැටලු සහගත තත්ත්වයන්ට මුහුණ දී ඇති බවට වන තොරතුරු විවිධ ජන මාධ්‍ය හා සමාජ මාධ්‍ය තුළින් හඳුනාගැනීමට පුළුවන. එබැවින් ශ්‍රී ලංකාව තුළ විකල්ප රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්මත වී ඇති අවස්ථාවක, එම ළමුන්ගේ උපරිම යහපත වඩාත් සක්‍රීයව පැවතීම සඳහා මනෝ සමාජීය මැදිහත්වීමක් සිදු කළ හැක්කේ කෙසේද? යන්න පිළිබඳ පුළුල් විග්‍රහයක් මෙම පර්යේෂණය මගින් සිදුවේ. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටලුව වශයෙන් **ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සැලසිය හැක්කේ කෙසේද ?** යන්න විග්‍රහ කෙරේ.

## 3. පර්යේෂණයේ අරමුණු

### 3.1. ප්‍රධාන අරමුණ

මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා මනෝ සමාජීය මැදිහත්වීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමයි.

### 3.2. සෙසු අරමුණු

1. ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ පසුබිම හඳුනාගැනීම
2. එම ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍ය මනෝ සමාජීය අවශ්‍යතා හඳුනාගැනීම
3. ඔවුන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම සඳහා ක්‍රියාකිරීමේ දී පවතින අභියෝග හා බාධක පිළිබඳ සොයා බැලීම
4. ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණය යටතේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා හිතකර මනෝ සමාජීය මැදිහත්කරණ ක්‍රමවේදයන් හඳුනාගැනීම

## 4. පර්යේෂණ ක්‍රමවේදය

### 4.1. අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම පර්යේෂණයෙහි අධ්‍යයන ක්ෂේත්‍රය වන්නේ ශ්‍රී ලංකාවේ ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානතම රාජ්‍ය ආයතනයක් වන වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවයි. වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂකසේවා දෙපාර්තමේන්තුවට අයත් නිකවැරටිය හා ආණමඩුව පරිවාස කාර්යාලයන්හි පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණයේ පසුවන ලිංගික අපයෝජනයට ගොදුරු වීම හේතුවෙන් විකල්ප රැකවරණය සඳහා යොමු කොට ඇති ගැහැණු ළමුන් හා ඔවුන්ගේ භාරකරුවන් මෙන්ම ඔවුන් අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් මෙම අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයින් ලෙස යොදාගෙන තිබේ. ඒ අනුව 2025 වර්ෂය තුළ විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් පදනම් කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. ලිංගික අපයෝජනයට ගොදුරු වූ හා දැනට විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් 10 දෙනෙකු හා ඔවුන්ගේ භාරකරුවන් 10 දෙනෙකු මෙන්ම ස්ථානභාර පරිවාස නිලධාරීන් දෙදෙනෙකු හා පරිවාස නිලධාරීන් තිදෙනෙකු මෙම අධ්‍යයනයේ දත්තදායකන් ලෙස යොදා ගන්නා ලදි.

### 4.2. නියැදිය

මෙම පර්යේෂණය සඳහා සසම්භාවීනොවන නියැදිය යටතේ පරමාර්ථානුගත නියැදිය භාවිතා කරන ලදි. පරමාර්ථානුගත නියැදිය යටතේ ප්‍රතිචාරකයන් 10 තෝරා ගත් අතර ඔවුන් තොරා ගැනීමේදි නිකවැරටිය හා ආණමඩුව පරිවාස කාර්යාල වල අධිකරණ වාර්තා ලේඛනයෙහි ලියාපදිංචි ලිංගික අපයෝජනයට ගොදුරු වී දැනට විකල්ප රැකවරණයේ පසුවන පරිවාස නිලධාරී අධික්ෂණයක් සහිත ගැහැණු ළමුන් 10 දෙනෙකු තොරා ගෙන තිබේ. එහිදි නිකවැරටිය පරිවාස කාර්යාලයේ අධීක්ෂණය යටතේ පසුවන ගැහැණු ළමුන් 05 දෙනෙකු හා ආණමඩුව

පරිවාස කාර්යාලයේ අධීක්ෂණය යටතේ පසුවන ගැහැණු ළමුන් 05 දෙනෙකු නියැදියට යොදා ගන්නා ලදි.

### 4. 3. දත්ත රැස්කිරීමේ ක්‍රමශිල්ප

මෙම පර්යේෂණයෙහි දත්ත රැස්කිරීමේදී මූලික දත්ත හා ද්විතීයික දත්ත රැස් කරගනු ලැබීය. මූලික දත්ත ලබා ගැනීමේදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා සහභාගී නොවන නිරීක්ෂණය උපයෝගී කරගන්නා ලද අතර ද්විතීයික දත්ත රැස්කිරීමේදී ළමා ලිංගික අපයෝජනය,විකල්ප රැකවරණය, ළමා අයිතිවාසිකම් හා ළමා සුභසාධනයට අදාළ පොත් පත්, වාර සඟරා හා ලිපි ලේඛන හා අන්තර්ජාල මූලාශ්‍ර භාවිතා කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම නිකවැරටිය හා ආණමඩුව පරිවාස කාර්යාලයන්හි අධිකරණ වාර්තා ලේඛනය හා වින්දිත ගැහැණු ළමුන්ගේ ලිපි ගොනු පරිශීලනය කිරීම මඟින් අධ්‍යයනයට අදාළ වැදගත් ද්විතීයික දත්ත රාශියක් ලබා ගන්නා ලදී.
මූලික දත්ත රැස්කිරීමේදී එය පහත පරිදි සිදු විය.
1.ප්‍රත්‍යයක අධ්‍යයන විධික්‍රමය
මේ යටතේ නිකවැරටිය ලිංගික අපයෝජනයට ලක්ව විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් 10 දෙනාගෙන් හා ඔවුන්ගේ භාරකරුවන්ගෙන් දත්ත ලබා ගන්නා ලදී.

4.3.1.නියමු සම්මුඛ සාකච්ඡා

මේ යටතේ නිකවැරටිය පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිළලධාරී හා පරිවාස නිලධාරීන් දෙදෙනකු හා ආණමඩුව පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරී හා පරිවාස නිලධාරිණියක් ලෙස ස්ථානභාර පරිවාස නිලධාරීන් හා පරිවාස නිලධාරීන් 05 ගෙන් තොරතුරු ලබා ගන්නා ලදි. නියමු තොරතුරු කෙරෙහි අවධානය යොමු කිරීමෙදි උක්ත ළමුන් සමග සෘජුවම වැඩ කටයුතු කරන සහ ඔවුන් අධීක්ෂණය කරන නිලධාරීන් යොදා ගැනීම මගින් ඔවුන්ගේ අත්දැකීම් හා අදාල සිද්ධීන් සඳහා ඔවුන් ගත් ක්‍රියා මාර්ග පිළිබඳ මෙන්ම ළමුන් සමග කටයුතු කිරීමේදි ඔවුන් මුහුණ දුන් අභියෝග හා ඔවුන්ගේ අදහස් යෝජනා පාදක කර ගනිමින් විකල්ප රැකවරණය තුළ ලාංකීය සාමාජයට අවැසි සුදුසු ක්‍රම වේදයක් සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශය ලබා ගැනීම සිදුවිය. එය පර්යේෂණයේ සමාජ වැඩ මැදිහත්වීමේ ශිල්පීය ක්‍රමෝපායන් නැවත සකස් කිරීමට මෙන්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශය ලබාදීම සිදු විය.

**දත්ත විශ්ලේෂණය**

මෙහි දත්ත විශ්ලේෂණය තේමා විශ්ලේෂණයක් (Thematic analysis) ලෙස සිදු කරන ලදි. එහිදි ලබා ගන්නා ලද දත්ත වගු සටහන්, රූප සටහන් හා ගැලීම් සටහන් සටහන් මගින් ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

### 4. පර්යේෂණ අනාවරණයන්

**4.1. ප්‍රතිචාරකයින්ගේ පසුබිම**
මෙම අධ්‍යයනය සඳහා සහභාගී වූ ප්‍රතිචාරකයින්ගේ මූලික තොරතුරු පහත පරිදි හඳුනාගත හැකිය.

**ප්‍රතිචාරකයින්ගේ මූලික තොරතුරු**

| ප්‍රතිචාරකයින්ගේ මනඃකල්පිත නම | වයස අවුරුදු | ආගම | අධ්‍යාපන මට්ටම |
|---|---|---|---|
| 1. ටානියා | 17 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 2. නිමාලි | 15 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 3.සඳලි | 16 | බෞද්ධ | 11 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබයි |
| 4.විනුදි | 16 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 5.නෙත්මි | 17 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 6.සුපුනි | 17 | කතෝලික | 08 ශ්‍රේණිය දක්වා |
| 7.නදී | 16 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 8.නිම්නා | 16 | බෞද්ධ | 09 ශ්‍රේණිය දක්වා |
| 9.චේතනා | 17 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |
| 10.සනුලි | 15 | බෞද්ධ | 10 ශ්‍රේණිය දක්වා |

**(මූලාශ්‍රය :- ක්ෂේත්‍ර දත්ත, 2025)**

ඉහත වගුව ඇසුරින් ප්‍රතිචාරකයින්ගේ වයස් ව්‍යුහය හා අධ්‍යාපන මට්ටම පිළිබඳව මූලික තොරතුරු හඳුනාගත හැකිය.

ඉහත දත්ත පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැහැදිළි වන්නේ දත්ත දායකයින්ගෙන් බහුතරයක් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත බවයි.

ළමා සංවර්ධනයේදී පවුල ප්‍රධාන සාධකයක් ලෙස පිළිගැනෙන නමුත් මෙහි දත්ත දායකයින්ගෙන් බහුතරයක් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත වීමෙන් බොහෝ ගැහැණු දරුවන් නව යොවුන් වියේදී ලිංගික අපයෝජනයන්ට ගොදුරු වී ඇති බව මෙහිදී අනාවරණය වී තිබේ. බිඳුණු පවුල් (Broken Families) පසුබිම තුළ දෙමාපියන් හා දරුවන් විභේදනයට ලක්වීම නිසා දරුවන්ට දැඩි අනාරක්ෂිතභාවයට පත්වේ. මෙවන් පසුබිමක් මත ගැහැණු ළමයකු පවුල තුළදී මෙන්ම සමාජය තුළදී ලිංගික අපයෝජනයට ගොදුරුවීමේ සම්භාවිතාවය ඉහළ මට්ටමක පවතී. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයින්ගේ පවුල් පසුබිම පිළිබදව අවධානය යොමු කිරීමේදී එම කාරණය තහවුරු වේ. එසේම පවුලේ සාමාජිකයන්ගේ සබඳතාවල ගැටළු සහගත ස්වභාවය, ගෘහ මූලිකයාගේ ගැටළු සහගත ස්වභාවය හා නොදැනුවත්භාවය ඔවුන් මෙසේ අඩු වයසින් ලිංගික අපයෝජනයට ලක්වීම කෙරෙහි බලපා ඇති බව හඳුනාගත හැකිය.

**4.2. නෛතික ස්වභාවය**

මේ යටතේ ප්‍රතිචාරකයින් ගොදුරු වී ඇති ලිංගික අපයෝජනයෙහි ස්වභාවය හා විකල්ප රැකවරණයේ ස්වභාවය පිළිබදව සාකච්ඡා කරනු ලැබේ.

| ප්‍රතිචාරකයින්ගේ මනඃකල්පිත නම | ලිංගික අපයෝජනයේ ස්වභාවය | විකල්ප රැකවරණයේ ස්වභාවය |
|---|---|---|
| ටානියා | නීත්‍යානුකූල භාරකාරීත්වයෙන් අපයෝජනය කොට ස්ත්‍රී දූෂණය | වසර 02 ක පරිලෝචන නියෝගයකි. දැරිය දෙමාපියන් සමීපයේ ජීවත් වේ. |
| නිමාලි | නීත්‍යානුකූල භාරකාරිත්වයෙන් අපයෝජනය | වසර 03 ක සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයකි. දැරිය මිත්තණිය සමීපයේ ජීවත් වේ. |
| සඳලි | ලිංගික අවයව ප්‍රදර්ශනය කර අපයෝජනයට ලක්වීම | වසර 03 ක පරිලෝචන නියෝගයකි. දැරිය දෙමාපියන් සමීපයේ ජීවත් වේ. |
| විනුලි | නීත්‍යානුකූල භාරකාරිත්වයෙන් අපයෝජනය කොට ස්ත්‍රී දූෂණය | වසර 01 ක කාලයක් සඳහා සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයකි. දැරිය මේ වන විට මිත්තණිය සමීපයේ සිටී. |
| නෙත්මි | නීත්‍යානුකූල භාරකාරිත්වයෙහි අපයෝජනය කොට ස්ත්‍රී දූෂණය | වසර 01 ක සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයකි. දැරිය මිත්තණිය සමීපයේ ජීවත් වේ. |
| සුපුන් | ස්ත්‍රී දූෂණය | වසර 03 ක පරිලෝචන නියෝගයකි. දැරිය මව සමීපයේ ජීවත් වේ. |
| නදී | ස්ත්‍රී දූෂණය හා අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | මාස 06 ක පරිලෝචන නියෝගයකි. දැරිය පියා සමීපයේ ජීවත් වේ. |
| නිම්නා | නීත්‍යානුකූල භාරකාරිත්වයෙන් අපයෝජනය කොට ස්ත්‍රී දූෂණය | වසර 01 ක සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයකි. දැරිය නෑදෑ සමීපයේ ජීවත් වේ. |
| චේතනා | ස්ත්‍රී දූෂණය | වසර 02 ක පරිලෝචන නියෝගයකි. දෙමාපියන් සමීපයේ ජීවත් වේ. |
| සනුලි | නීත්‍යානුකූල භාරකාරිත්වයෙන් අපයෝජනය කොට ස්ත්‍රී දූෂණය | වසර 01 ක පරිලෝචන නියෝගයකි. දෙමාපියන් සමීපයේ ජීවත් වේ. |

(මූලාශ්‍රය- ක්ෂේත්‍ර දත්ත, 2025)

### 4.3. ලිංගික අපයෝජනයේ ස්වභාවය

මෙම පර්යේෂණයෙහි දත්තදායකයින්ගේ පසුබිම හඳුනාගැනීමේදී ඔවුන් ගොදුරු වූ ලිංගික අපයෝජනයේ ස්වභාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට සිදුවේ. ඒ අනුව ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් ළමා ලිංගික අපයෝජනයට අදාළ වැරදි අතරින් පහත සඳහන් වැරදි සඳහා ප්‍රතිචාරකයින් ගොදුරු වී තිබේ.

**ලිංගික අපයෝජනයේ ස්වභාවය**

| | වරද | ගොදුරු වූ ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ස්ත්‍රී දූෂණය (ද.නී.ස. 363 වගන්තිය) | 02 |
| 2 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය හා ස්ත්‍රී දූෂණය | 05 |
| 3 | ලිංගික අතවර | 01 |

| | | |
|---|---|---|
| 4 | ලිංගික අවයව ප්‍රදර්ශනය කිරීම | 01 |
| 5 | ස්ත්‍රී දූෂණය හා අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 01 |
| | **එකතුව** | **10** |

(මූලාශ්‍රය ක්ෂේත්‍ර දත්ත 2025)

ඒ අනුව ප්‍රතිචාරකයින්ගෙන් 8 දෙනෙකු ස්ත්‍රී දූෂණය වරද සඳහා ගොදුරු වී ඇති අතර ඉන් තිදෙනෙකු ළමා මව්වරුන් බවට පත්වී තිබේ. ගැහැණු ළමුන්ට එරෙහිව කරනු ලබන ලිංගික අපයෝජන අතරින් බරපතලම අපයෝජනය වන්නේ ස්ත්‍රී දූෂණයයි. ස්ත්‍රී දූෂණයට ගොදුරු වන ළමුන් තුළ පසුකාලීනව විවිධාකාර වූ මානසික හා කායික ආබාධ ඇතිවීමේ ප්‍රබල අවදානමක් පවතින බැවින් ඔවුන්ගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීමේදී ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමුකිරීම අත්‍යාවශ්‍ය වේ.

බොහෝ ගැහැණු ළමුන් ලිංගික අපයෝජන සඳහා ගොදුරු කරගනු ලබන්නේ තමා කෙරෙහි වගකීමක්, විශ්වාසයක්, බලයක් දරන පුද්ගලයන් විසිනි. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිචාරකයින් අතුරින් 7 ක් ප්‍රේම සබඳතා මත ඇතිවූ විශ්වාසය මත පදනම්ව ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත. 1 ක් වගකීම, විශ්වාසය හා බලය සහ ඥාතීත්වය මත පදනම්ව ලිංගික අපයෝජනය සඳහා ගොදුරු වී තිබේ. 2 ක් ආගන්තුකයින් වන පුද්ගලයින්ගේ බලය මත පදනම්ව ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ.

මෙම අධ්‍යයනයට සහභාගී වූ ප්‍රතිචාරකයින් ලිංගික අපයෝජනයට ගොදුරුවීමෙහිලා බලපා ඇති හේතු සාධක ලෙස පහත සඳහන් හේතු සාධක හඳුනාගත හැකිය.

01. බිඳුණු පවුල් පසුබිම
02. ළමයින්ගේ නොදැනුවත්භාවය
03. අඩු වයසින් ප්‍රේම සබඳතා සඳහා පෙළඹීම
04. අනාරක්ෂිත පරිසරය
05. අයහපත් සමාජානුයෝජනය
06. ජංගම දුරකථන භාවිතය
07. ලිංගික අධ්‍යාපනය විධිමත්ව නොලැබීම
08. පුද්ගල බද්ධ සාධක (සමාජ විරෝධී පෞරුෂ ලක්ෂණ)
09. මවගේ ආදරය, රැකවරණය නොමැති වීම
10. නව යොවුන් වියේ අවශ්‍යතා ඉටුනොවීම
11. ආර්ථික අපහසුතා
12. ළමා අයිතිවාසිකම් පිළිබඳ වැඩිහිටියන්ගේ අනවබෝධය

(ක්ෂේත්‍ර දත්ත, 2025)

### 4.4. ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා අවශ්‍ය මනෝ සමාජීය අවශ්‍යතා

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසු වන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා යහපැවැත්ම ඉතාවැදගත් සාධකයකි. ළමා යහපැවැත්ම විවිධ ආකාරවලින් අර්ථ දක්වා ඇති අතර, මෙම යෙදුම පුළුල් පරාසයක වෘත්තිකයන්, පර්යේෂකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් භාවිතා කරනු ලැබේ. පොදුවේ ළමයින්ගේ යහපැවැත්ම සඳහා කටයුතු කිරීමේදී කායික යහපැවැත්ම, මානසික යහපැවැත්ම, සමාජීය යහපැවැත්ම හා අධ්‍යාත්මික යහපැවැත්ම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. කායිත යහපැවැත්ම සඳහා කායික වශයෙන් ලැබිය යුතු අවශ්‍යතා සැපිරිය යුතු අතර මානසික හා සමාජීය යහපැවැත්ම සඳහා සඳහා මනෝ සමාජීය අවශ්‍යතා ඉතා වැදගත් වේ. ලිංගික අපයෝජනයට ලක්ව සිටින ගැහැණු ළමුන්ගේ යහපැවැත්ම උදෙසා කටයුතු කිරීමේදී මනෝ සමාජීය අවශ්‍යතාවයන් කොතෙක් දුරට සැපිරී

ඇත්දැයි යන්න පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු කළ අතර අධ්‍යයනයට ලක් වූ ප්‍රතිචාරකයින්ගේ ප්‍රතිචාර තුළින් ඔවුන්ගේ මනෝ සමාජීය අවශ්‍යතාවයන් සැපිරී ඇති ආකාරය හඳුනාගත හැකිය.

"මම ගිය ආත්මෙ ලොකු පවක් කරන්න ඇති ඒකයි පොඩි කාලෙම අම්මගෙයි තාත්තගෙයි ආදරය අහිමි වුණේ. දැන් නම් මට මගේ ජීවිතය එපා වෙලා තියෙන්නෙ. මැරෙන්ඩ කියලා හිතුණු වාර අනන්තයි. ඒත් මම මැරුණොත් මේ දරුවා අසරණ වෙනවා. අදටත් මම ජීවත් වෙන්නේ මේ දරුවා නිසා. මොකද මට අත්වුණ ඉරණම මේ දරුවට අත්වෙනවට මම කැමති නෑ."

(නිම්නා, ප්‍රත්‍යයෙක අධ්‍යයන 08)

ලිංගික අපයෝජනයට ලක්වී ළමා මවක් බවට පත්වී සිටින නිම්නා දැරියගේ ප්‍රකාශය තුළින් පැහැදිළි වන්නේ ඇය හට මනෝ සමාජීය අවශ්‍යතා නිසි ලෙස නොලැබෙන බවයි. ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන් මනෝ විද්‍යාත්මකව හා සමාජ විද්‍යාත්මකව බරපතල අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ පාන අතර ඔවුන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම සඳහා කටයුතු කිරීමේදී මනෝවිද්‍යාත්මක උපදේශනය ඵලදායී ලෙස යොදා ගැනීමට හැකියාව තිබේ. කරුණාරත්න (2015) සඳහන් කර ඇත්තේ ලිංගික අපයෝජනයට ගොදුරු වී ආයතන ගත ළමුන් නැවත සමාජගත කිරීමේදී මනෝවිද්‍යාත්මක උපදේශනය ඵලදායී අන්දමින් යොදා ගත යුතු බවයි. පුද්ගල, පවුල් හා කණ්ඩායම් උපදේශනය මෙන්ම ප්‍රජා උපදේශනයද ලිංගික අපයෝජනයට ගොදුරු වූ ළමුන්ගේ මනෝ සමාජීය අවශ්‍යතා සපුරාලීමේදී අත්‍යාවශ්‍ය වේ. මනෝ විද්‍යාත්මක උපදේශනය මගින් ලිංගික අපයෝජනයට මුහුණ දීමෙන් බිඳ වැටී ඇති ආත්ම අභිමානය නංවාලීම, මානසික අක්‍රමතා සඳහා ප්‍රතිකාර කිරීම, මනෝ සමාජීය අධ්‍යාපනය ලබාදීම මෙන්ම ප්‍රජානනය හා චර්යාව වෙනස් කිරීමට හැකියාව ඇත. එබැවින් ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන් සඳහා ද මනෝ විද්‍යාත්මක උපදේශනයේ අවශ්‍යතාවය නිම්නා දැරියගේ ප්‍රකාශය තුළින් තහවුරු වේ.

මනෝ සමාජීය අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීමේ ප්‍රතිචාරකයින් දැක්වූ පහත සඳහන් අවශ්‍යතා ඔවුන්ගේ යහපැවැත්ම කෙරෙහි ඉතා වැදගත් වේ.

1 පිළිගැනීම
2 ආදරය, කරුණාව හා දයාව
3 රැකබලා ගන්නන්ගේ උණුසුම් සහගත සෙනෙහස හා රැකවරණය
4 විවේකය හා විනෝදාශ්වාදය
5 ආත්ම අභිමානය
6 සමපදස්ථ ඇසුර
7 සමාජ ක්‍රියාකාරකම්

(ක්ෂේත්‍ර දත්ත, 2022)

ටානියා දැරියගේ ප්‍රකාශය අනුව පැහැදිළි වන්නේ ඇයට සිය නිවස තුළ මනෝ සමාජීය අවශ්‍යතා සපුරා ගැනීමට ඉඩකඩ නොමැති බවයි.

*"අම්මයි තාත්තයි හැම වෙලාවෙම කියන්නෙ මම එයාලගෙ මූණෙ දැලි ගෑව කියලා. මම නිසා එයාලට පාරේ බැහැලා යන්න බැරිලු. අයියල දෙන්නයි අක්කයි ඉස්සර වගේ මට ආදරය දක්වන්නේ නෑ. ගමේ මිනිස්සු මා දිහා බලන්නෙ සමච්චලයට මට දූන් හැමදේම එපා වෙලා තියෙන්නේ. මේක මහා කරුමයක්."*

(ටානියා, ප්‍රත්‍යයක අධ්‍යයන 01)

මෙහිදී අධ්‍යයනයට ලක් වූ චේතනා දැරියගේ ප්‍රකාශය තුළින් මනෝ සමාජීය අවශ්‍යතාවය පිළිබඳ තහවුරු වේ.

*"මම කොච්චර හොඳට හිටිය කෙනෙක්ද? ඌ මාව බය කරලා මගේ ජීවිතයම විනාශ කලා. දැන් මට මගේ යාළුවො වගේ ඉස්කෝලේ යන්න විදිහක් නැහැ. මේ සිද්ධිය නිසා මට කාටවත් මුහුණ දෙන්න විදිහක් නෑ. ඇයි මට මෙහෙම වුනේ කියලා මට හිතා ගන්නවත් බෑ."*

(චේතනා, ප්‍රත්‍යයෙක අධ්‍යයන 01)

සමාජීය යහපැවැත්ම ළමයෙකුගේ උපරිම යහපත කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීමට චේතනාගේ ප්‍රකාශය ප්‍රබල සාක්ෂියකි. ළමා සංවර්ධනයේදී මනෝ සමාජීය යහපැවැත්ම ඉතා වැදගත් වේ. ඒ සඳහා මනෝ සමාජීය අවශ්‍යතා සැපිරීමට කියා කිරීම තුළ ළමුන්ගේ උපරිම යහපත සැලසීමට අවකාශය සැලසේ.

"මේ දරුවගේ අම්මා රට ගියේ සල්ලි පොලියට අරගෙන. එයා රට ගිහින් දැන් අවුරුදු දෙකකටත් කිට්ටුයි. මගේ පුතාට සල්ලි පොලියට ගත්ත මනුස්සයගෙන් නිතරම කරදරේ. මේ වෙනකොට ලොකු මුදලක් ඒ මනුස්සයට දෙන්න ඕන. පුතා හම්බ කරන මුදල් ගෙදර වියදමටත් මදි. දරුවගේ අම්ම රට ගිය නිසා අපිට සමෘද්ධිය ලැබෙන්නෙත් නෑ."

(නෙත්මි දැරියගේ මිත්තණිය, ප්‍රත්‍යයෙක අධ්‍යයන 5)

විදේශගත වීම සඳහා මව ලබාගත් මුදල ගෙවීමට නොහැකිව පවුලේ සියලුමදෙනාගේ මානසික යහපැවැත්ම බිඳ වැටී ඇති බව මෙම අධ්‍යයනය තුළදී හඳුනාගත හැක.

### 4.5. විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි පවතින අභියෝග හා බාධක පිළිබඳව අවධානය යොමු කිරීමේදී ප්‍රතිචාරකයින් ලෙස ලිංගික අපයෝජනයට ගොදුරු වූ ගැහැණු ළමුන්,ඔවුන්ගේ භාරකරුවන් හා ඔවුන් අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් යොදා ගන්නා ලදී. ඔවුන් විසින් ලබා දෙන ලද තොරතුරු ඇසුරින් වර්තමානයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක පිළිබඳව අවබෝධ කර ගත හැකිය.

ප්‍රතිචාරකයින් අතරින් ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ අදහස් විමසීමේදී ඔවුන් මුහුණපාන අභියෝග සහ බාධක ලෙස සමාජ අපවාද සහ සමාජ සහය නොලැබීම,ඇතැම් පුද්ගලික කාරණා,අධ්‍යාපනය අතරමග නැවතීම හා නීතිය පිළිබද මෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබද නොදැනුවත්භාවය, නඩු විභාගය සඳහා දීර්ඝ කාලයක් ගතවීම යනාදිය සුවිශේෂි වේ. ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි අවශ්‍ය ප්‍රධානතම කාරණා වන ළමා ආරක්ෂාව, සංවර්ධනය,යහපැවැත්ම,සුහසාධනය සහ පුනරුත්ථාපනය යනාදිය විධිමත් ව සිදුවීම කෙරෙහි ඉහත සඳහන් අභියෝග හා බාධක ප්‍රබල ලෙස බලපෑමක් එල්ල කරනු ලබයි.

සමාජ අපවාදය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය ප්‍රතිචාරකයින් බහතරයක් සඳහා බලපා ඇති ප්‍රබල අභියෝගයකි.ඔවුන් එය පවුලට හා සමාජයට කැලැලක් හා අපකීර්තියක් ලබා දීමට කටයුතු කළ බව පවසමින් ඔවුන්ගේ පවුල්වල ඥාතීන් මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයින් ඔවුන්ව විවිධාකාරයේ චෝදනා සහ අපකීර්තියට ලක් කිරීම් සිදු කරන බවට ප්‍රතිචාරකයින් ප්‍රකාශ කොට ඇත.ඒ හේතුවෙන්ම බහුතරයකගේ අධ්‍යාපනය අතරමග නැවතී තිබේ.

ප්‍රතිචාරකයින් අතරින් ටානියාගේ අදහස් තුළින් ඒ බව හොඳින් පැහැදිලි වෙයි.

*"අපේ නැදෑයින්වයි ගමේ අයයි මාර අමාරුවක් තමයි තියෙන්නෙ.එයාලා නිතරම මට ඇනුම් පද කියනවා. අම්මයි තාත්තයි දෙන්නත් ඉස්සර වගේ නෙමේ.හැම වෙලාවෙම මගේ හිත රිදෙන විදිහට තමයි වැඩ කරන්නේ."*

*(ටානියා,ප්‍රත්‍යෙයක, අධ්‍යයන 01)*

නදී දැරියගේ පියා පොලිස් නිලධාරියෙකු ලෙස සමාජීය වශයෙන් හොඳ පිළිගැනීමක් සහිතව ජීවත් වූ තැනැත්තෙකි.ඇයගේ සහෝදරයන් දෙදෙනා මේ වන විට උසස් අධ්‍යාපනය ලබයි.ඇය අඩු වයසින් ලිංගික අපයෝජනයට ගොදුරු වීම හේතුවෙන් පවුලේ ඥාතීන් මෙන්ම සමාජයේ විවිධ පුද්ගලයන් ඇයව සමාජ අපවාදයට ලක් කරන බව ඇය ප්‍රකාශ කරයි.

*"සමහර අය මට කියනවා තාත්තගේ මූණෙ දැලි ගාපු කාලකණ්ණි කෙල්ල කියලා."*

*(නදී, ප්‍රත්‍යෙයක, අධ්‍යයන 01)*

නදී දැරියගේ අදහස් අනුව හඳුනාගත හැක්කේ සමාජීය වශයෙන් ඇය අපවාදයන්ට, සමච්චලයන්ට නිරතුරුව ලක්වන බවයි.එය ඇයගේ උපරිම යහපත කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කිරීමට හේතුවේ.මෙම සමාජ අපවාදයෙන් ගැලවීමට තම නිවසින් ඈත් වීමට ඇය උත්සහ ගනී.එය එක් පසකින් විකල්ප රැකවරණයේ සාර්ථක ප්‍රතිඵල ලැබීමට බාධකයකි.ඇයගේ මානසික සතුට බිඳ වැටීමට සමාජ අපවාද ප්‍රධාන හේතුවක් බවට පත් වී ඇත.එසේම ඇයගේ යහපැවැත්ම හා සංවර්ධනය කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කරනු ලබයි.

Goffman (1986) සඳහන් කර ඇති පරිදී අතාත්වික සමාජ අනන්‍යතාවය සමාජය විසින් අපේක්ෂා කරන ස්වාත්මක වන අතර එය පුද්ගලයා විසින් සිදු කරතැයි සමාජය අපේක්ෂා කරයි.නමුත් සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදී පුද්ගලයෙකුට සමාජය අපේක්ෂා කරන ආකාරයටම හැසිරිය නොහැකිය.සමාජය ප්‍රතික්ෂේප කරන හැසිරීම් මෙන්ම තම පුද්ගල කැමැත්තට අනුව ක්‍රියාකාරී වීම ආදිය හේතුවෙන් යථාර්ථ හැසිරීම අපේක්ෂිත හැසිරීමට වඩා වෙනස් විය හැකිය.එය සමාජ ධර්මතා හෝ අගනාකම්වලට යම් ආකාරයක

නොගැලපීමක් විය හැකිය.එය දිගින් දිගටම සිදුවීමෙන් පුද්ගලයා පිළිබඳ සමාජ නිශේධනාත්මක තීන්දුවකට එළඹේ. එය පුද්ගලයාට කැළලක් (*Stigma*) සිදුවීමක් හෙවත් අපකීර්තියට පත්වීමක් ලෙස සැලකේ. මෙම අධ්‍යයනයෙහි බහුතරයක් ප්‍රතිචාරකයින් සමාජ අපවාදයට ලක්වීම තුළ ඔවුන්ගේ උපරිම යහපතට බාධාවක් පවතී.

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ළමුන් මුහුණ දෙන අභියෝග සහ බාධක අතරින් තවත් එක් වැදගත් බාධකයක් ලෙස ඇතැම් පුද්ගලබද්ධ සාධක හඳුනා ගත හැකිය.සමහරක් ප්‍රතිචාරකයින් තුළ ඔවුන්ටම සුවිශේෂි වූ පුද්ගලබද්ධ සාධක ඔවුන්ගේ උපරිම යහපතට බරපතල තර්ජනයක් වී තිබේ.ඒ අතරින් නිමාලි දැරියගේ පුද්ගලබද්ධ සාධක වෙත අවධානය යොමු කිරීම වැදගත් වේ.

*''මට පරිවාසෙ සර්ල මිස්ලා විතරක් නෙවෙයි නඩුකාරතුමියත් කිව්වා ඉස්කෝලෙ යන්න කියලා.ඒත් කවුරු කිව්වත් මම ආයෙත් නම් ඉස්කෝලෙ යන්නෙ නෑ.ඒක මගේ තීරණයක්.මට ඕනෙ නිදහසේ ගෙදරට වෙලා ඉන්න''*

*(නිමාලි,ප්‍රත්‍යයක, අධ්‍යයන 01)*

වයස අවුරුදු 14 දී ලිංගික අපයෝජනයට ගොදුරු වු නිමාලි 09 ශ්‍රේණිය දක්වා පමණක් අධ්‍යාපනය ලබා තිබේ.අදාළ ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙන් පසු වර්තමානය දක්වාම ඇයගේ පාසල් අධ්‍යාපනය අඩාල වී තිබේ.පරිවාස නිලධාරීන් විසින් මේ පිළිබඳව මහේස්ත්‍රාත් දැනුවත් කොට මහේස්ත්‍රාත් විසින් දැරියට අවවාද කර ඇත.එසේ වුවත් වර්තමානයේදී ඇය නිවසට වී කාලය ගත කරනු ලබයි.

නදී දැරිය පළමුවරට ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත්තේ වයස අවුරුදු 15දීය.අනතුරුව ඇය අඩු වයසින් අඛණ්ඩව එම චර්යාවන්ට ගොදුරු වී තිබේ.ඒ සඳහා ඇබ්බැහිවීමක් ඇය තුළින් හඳුනා ගත හැකිය.

*''මට මගේ හැගීම් පාලනය කරගන්ඩ අමාරුයි.හැම වෙලාවෙම හිතට එන්නේ විවිධ ආශාවන්.ඒ හින්දා තමයි පිරිමින් කිහිපදෙනෙක් එක්කම සම්බන්ධකම් පටන් ගත්තෙ. ඒ හැමෝම මාත් එක්ක එකට හිටියා.''*

*(නිමාලි,ප්‍රත්‍යයක, අධ්‍යයන 01)*

නදී දැරිය ප්‍රකාශ කරන ආකාරයට ඇයට ඇයගේ ආශාවන් හා හැගීම් පාලනය කර ගැනීමට අපහසු වී තිබේ.එම නිසා විවිධ පුද්ගලයන්ගේ ලිංගික ගොදුරක් බවට ඇය පත් වී තිබේ.

අධ්‍යයනයට ලක් වූ මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපතට බලපා ඇති අභියෝගයක් වන්නේ ඔවුන් බහුතරයකගේ පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමට සිදුවීමයි.පුද්ගල සමාජානුයෝජනයෙහි කැපී පෙනෙන ආයතනයක් වන්නේ පාසලයි.පාසල් සමාජානුයෝජන කාරණයක් වශයෙන් මෙන්ම පුද්ගල කුසලතා පරිපූර්ණ කරනු ලබන විධිමත් ආයතනයක් වශයෙන් දරුවන්ගේ ජීවිතයෙහි වඩාත්ම වැදගත් අවධිය පෝෂණය කිරීමෙහිලා මහගු කාර්යභාරයක් ඉටු කරමින් සිටි.(සුභසිංහ,2016,පි,68) ළමා පෞරුෂත්වය සංවර්ධනයේදී පාසල් අධ්‍යාපනය වඩාත් වැදගත් වේ.පාසල් අධ්‍යාපනය මගින් කුසලතාපූර්ණ ශිෂ්‍යයෙකු බිහිවන අතර රටේ අනාගත සංවර්ධනය උදෙසා එම පුද්ගලයාගේ දැනුම,කුසලතා සහ ආකල්ප ඵලදායි ලෙස යොදා ගත හැකිය.එහෙත් ලිංගික අපයෝජනයට ගොදුරු වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැහැණු ළමුන්ගේ පාසල් අධ්‍යාපනය අතරමග නැවැත්වීමට සිදුවීම රටේ සංවර්ධනයට ප්‍රබල තර්ජනයකි. මෙම අධ්‍යනයෙන් හඳුනාගනු ලැබේ. ඒ සඳහා ළමුන්ගේ උපරිම යහපතට බලපාන තවත් බාධකයක් වශයෙන් ළමුන්ට අදාළ නීතිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රතිචාරකයින් සතු දැනුම අවම මට්ටමක පැවතීමයි.ප්‍රතිචාරකයින්ගේ භාරකරුවන් බහුතරයක්ම ඒ පිළිබඳව දැනුමක්,අවබෝදයක් විධිමත් ආකාරයෙන් නොමැති බව මෙම අධ්‍යයනයේ දි හඳුනා ගත හැකි විය.

*''අපේ දරුවා ගිය ආත්මෙ මොකක් හරි ලොකු පවක් කරලා ඇති.ඒකයි එයාට ඔහොම දෙයක් වෙන්න ඇත්තෙ.මට පුළුවන් විදිහට මම එයාව බලා ගන්නවා.''*

*(විනුදි දැරියගේ මිත්තණිය,ප්‍රත්‍යෙයක අධ්‍යයන 04)*

මෙම මිත්තණියගේ අදහස වන්නේ පෙර කර්මයක් හේතුවෙන් දැරියට මෙම සිදුවීමට මුහුණ දී ඇති බවයි.ඇය ළමා අයිතිවාසිකම් හෝ ළමා නීතිය පිළිබඳ කිසිදු අවබෝදයකින් තොරව කටයුතු කරන බව මෙමගින් පැහැදිලි වෙයි.

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහුණු ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි බලපාන තවත් එක් ප්‍රබල සාධකයක් ලෙස භාරකරුවන්ගේ පවුලේ ආර්ථික අපහසුතාවයන් හඳුනා ගත හැකිය.ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් සහිත ප්‍රදේශයක ජීවත් වන මෙම පවුල්වල ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තයයි. කෘෂිකර්මාන්තය මගින් පවුලේ ආර්ථිකය නගා සිටුවීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ මව හෝ පියා විදේශගත වීමයි.එසේ විදේශගත වී නැවත පවුල පිළිබඳ සොයා බැලීමක් සිදු නොකිරීම හා ඔවුන් වෙනත් විවාහයකට යොමු වීම තුළ ඇතැම් පවුල් අසරණ වී ඇති බව මෙහිදී නිරීක්ෂණය විය.

මෙහිදී අවධානයට ලක් වූ නෙත්මි දැරිය පිළිබඳ සැලකීමේදී ඇයගේ මව පවුලේ ආර්ථික අපහසුතා හේතුවෙන් විදේශගත වී ඇත.ඇයට විදේශගත වීම සඳහා පියා ණය වී මුදල් සොයා ගෙන තිබේ.එහෙත් ඇය විදේශගත වූ පසු නිවස සමග සබඳතා නවතා දමා ඇත.ඒ හේතුවෙන්

පවුලේ ආර්ථිකය අඩාල වී තිබේ. විස්තෘත පවුලක් වන මෙම පවුලේ සාමාජිකයන්ගේ පෝෂණය සහ සුභසාධනය උදෙසා මාසිකව විශාල මුදලක් වැය වන බැවින් මෙම පවුල ආර්ථික අපහසුතා රාශියකින් පෙළෙන බව හඳුනාගත හැකි විය.ඇයගේ මව විදේශගත වීම හේතුවෙන් සමෘධි දීමනාව ද ඔවුන්ගේ පවුලට නොලැබේ.මව විදේශගත වීමට ලබාගත් ණය මුදල් සඳහා පොළියත් දිනෙන් දින එකතු වේ.එම මුදල ගෙවීමට පියාට හැකියාවක් නොමැත.නෙත්මිගේ අධ්‍යාපනය බිඳ වැටීමද මෙම කාරණාවට හේතු වී තිබේ.එබැවින් ලිංගික අපයෝජනයට ලක් වී විකල්ප රැකවරණයේ පසුවන මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපත ඇති කිරීමේදී ඔවුන්ගේ ආර්ථිකය ඉහළ නංවාලීමේ ක්‍රමවේදයක් අත්‍යාවශ්‍ය බව පෙනේ.

නියමු සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ ආණමඩුව පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරිවරයාගේ අදහස වූයේ මෙම පවුල සඳහා සමෘද්ධි සහනාධාරය හෝ ලබාදීමට හැකියාවක් නොමැති බවයි. එයට හේතුව මෙම දැරියගේ මව විදේශ ගතවීමයි. ඇයගේ මව විදේශගත වුවද විදේශ ගතවීමට ලබාගත් පොලී ණය මුදල් වසර දෙකක් තිස්සේ එකතු වී විශාල මුදලක් පොලී හිමියා වෙත ලබාදීමට සිදුවී තිබේ. කම්කරුවෙකු ලෙස කටයුතු කරන දැරියගේ පියා උපයන මුදල නිවසේ වියදමට පවා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඔවුන්ගේ දෛනික ජීවිතයට විශාල බලපෑමක් එල්ල වී ඇත. එම බලපෑම අනෙක් අතට දැරියගේ උපරිම යහපත කෙරෙහි තීරණාත්මකව බලපා ඇති බව පැහැදිළිය.

ලිංගික අපයෝජනයකට ගොදුරුවීමෙන් අනතුරුව විකල්ප රැකවරණයට යොමු කොට ඇති මෙම ගැහැණු ළමයින්ගේ උපරිම යහපත කෙරෙහි බලපාන්නා වූ තවත් එක් සාධකයක් වන්නේ ඔවුන්ගෙ 'නඩු විභාගය සඳහා දීර්ඝ කාලයක් ගතවීමයි. මෙම අධ්‍යයනයේ සඳහන් සියලුම ගැහැණු ළමයින්ගේ අධිකරණ නඩු තවමත් අවසන් වී නැත. සමහරක් නඩු පොලිස් විමර්ශනයේ පවතින අතර ඇතැම් නඩු නීතිපති වෙත යොමු කොට තිබේ. ටානියා දැරියගේ නඩුව දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිළි වන්නේ ඇය ලිංගික අපයෝජනයට ගොදුරු වන විට ඇයගේ වයස අවුරුදු 14 ක් බවයි. මේ වන විට ඇගේ වයස අවුරුදු 16 යි මාස 02 කි. එම නඩුව වසර 02 කට වැඩි කාලයක් විභාග වෙමින් පවතී. සදලි දැරියගේ නඩුව දෙස අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැක්කේ ඇය ලිංගික අපයෝජනයට සඳහා ගොදුරු වන විට ඇයගේ වයස අවුරුදු 13 ක් බවයි. මේ වන විට ඇයගේ වයස අවුරුදු 16 කි. වසර 03 ක් තිස්සේ ඇයගේ නඩුවද අධිකරණයේ විභාග වෙමින් පවතී. මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සූදානමින් සිටින ඇයගේ අධ්‍යාපනික කටයුතු සහ අනෙකුත් සියලුම කටයුතු සඳහා මෙම නඩුව දිගින් දිගටම පැවතීම බලවත් අභියෝගයකි. ඇය සඳහන් කළේ ඇය පිළිබඳව පරිවාස නිලධාරීන් අධීක්ෂණය කිරීම ද ඇයට ගැටලු සහගත වී ඇති බවයි. තමාට සැකකරුගෙන් ශාරීරිකව හානියක් නොවූ නමුත් අධිකරණය, පොලීසිය හා පරිවාසය යන ආයතන වල නිලධාරීන්ගේ ක්‍රියාකළාපය හේතුවෙන් ඇය මානසික වශයෙන් අතෘප්තියෙන් පසුවන බව ඇය සඳහන් කරයි. දිගු කාලයක් තිස්සේ නඩු විභාගවීම මෙම ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සෘජුව හා වක්‍රාකාරව බලපාන බව ඉහත ප්‍රත්‍යයක අධ්‍යයනයන් තුළින් වඩාත් හොඳින් තහවුරු වේ.

පරිවාස නිලධාරීන් සමග පවත්වන ලද නියමු සම්මුඛ සාකච්ඡාවේදී ද ඒ පිළිබඳව තවදුරටත් කරුණු අනාවරණය විය.

“ලිංගික අපයෝජන නඩුවක් අඩුම තරමින් අවුරුද්ක් ඇතුළතදී වත් අවසන් කරන්න පුළුවන් නම් ඒක මේ ළමයින්ගේ අනාගතයට හොඳයි. දිගින් දිගටම නඩු ප්‍රමාදවීම නිසා මේ ළමයින්ට ගොඩක් කාලයක් යනකන් අපේ අධීක්ෂණයේ තියාගන්න වෙනවා ”

(ස්ථානභාර පරිවාස නිලධාරී, නිකවැරටිය)

මෙහිදී අනාවරණය වන වැදගත් කරුණු 02 ක් ඇත. ඉන් එක් කාරණයක් වන්නේ වැඩිකාලයක් පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණයේ පසුවීමට වින්දිත දැරියන් අකමැතිවීමයි. අනෙක් කාරණය වන්නේ එම දැරියන් පිළිබඳව දිගු කාලීනව අධීක්ෂණය කිරීමට පරිවාස නිලධාරීන් ද අකමැතිවීමයි. නඩු දිගින් දිගටම ප්‍රමාදවීම හේතුවෙන් මෙසේ දිගුකාලීනව පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණයට ළමුන් යොමු කරනු ලැබේ. තවද ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි පරිවාස නිලධාරින්ගේ අධීක්ෂණයෙහි ස්වරූපයද බලපාන බව මෙහිදී අනාවරණය විය.

මෙම ළමයින්ගේ උපරිම යහපතට පවතින අභියෝග හා බාධක අතරින් තවත් එක් වැදගත් බාධකයක් වන්නේ ළමුන් හා ඔවුන්ගේ පවුල සඳහා සුභසාධන සේවාවන් විධිමත්ව නොලැබීමයි. වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශනයේ දැක්වෙන්නේ වයඹ පළාත තුළ අනාථ, අසරණ හා අත්හළ ළමුන් ශාරීරික, මානසික හා සදාචාරාත්මක වශයෙන් සංවර්ධනය කිරීමත්, ඔවුන් උදෙසා සියලු ආකාරයෙන් සුභසාධන කටයුතු හා රැකවරණය සැලැස්වීමත්, ළමා අයිතිවාසිකම් සහ ළමුන්ගේ සමාජ ගරුත්වය සුරක්ෂිත කිරීමත් තුළින් සංවර්ධනයේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්වීමයි. (මූලාශ්‍රය - කාර්ය සාධන වාර්තාව, 2020) ඒ අනුව ලිංගික අපයෝජනයෙහි වින්දිතයින් බවට පත්වී විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ සුභසාධන කටයුතු සිදුකිරීමට දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කළ යුතුය.

පරිවාස නිලධාරීන් හා ස්ථානභාර පරිවාස නිලධාරීන් සමගින් සිදුකරන ලද නියමු සම්මුඛ සාකච්ඡාවන් මගින් පැහැදිළි වූ කරුණක් වන්නේ සුභසාධන සේවාවන් ප්‍රායෝගිකව සිදුකිරීමේදී ගැටළුකාරී තත්ත්වයන් රැසකට ඔවුන් මුහුණ දී සිටින බවයි.

"ගෙවල් අනාරක්ෂිතව තිබෙන දරුවන්ගේ යහපත වෙනුවෙන් අපේ දෙපාර්තමේන්තුව මගින් නිවාස ආධාර ලබා දෙනවා. ඒ සඳහා රුපියල් ලක්ෂ 5 ක් එක් පවුලක් වෙනුවෙන් වෙන් කරනවා. ඒත් අද කාලෙ බඩු වල ගණන් බැලුවම ඒ ලක්ෂ පහට කුස්සියක්වත් හදාගන්න අමාරුයි. ළමයින්ගේ භාරකරුවන්ගේ සහයෝගය ලැබුණොත් අපේ වෙනත් සම්බන්ධතාත් උපයෝගී කරගෙන කොහොමහරි කරලා ගේ හදලා සම්පූර්ණ කරගන්න පුළුවන්. ඒත් ඒක අමාරු වැඩක්. මේ අවුරුද්දේ ඉදලා නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන ඉදිරියට කරගෙන යන්න සල්ලි නෑ කියලා දෙපාර්තමේන්තුවේ අපව දැනුවත් කරලා තියෙනවා."

(ස්ථානභාර පරිවාස නිලධාරී, නිකවැරටිය, නියමු සම්මුඛ සාකච්ඡා 01)

නියමු සම්මුඛ සාකච්ඡාවේදී ලබාදුන් ඉහත තොරතුරු අනුව හඳුනාගත හැක්කේ මෙම දරුවන්ගේ සුභසාධනය උදෙසා මූල්‍යමය ආධාර ලබාදීම වර්තමානය වන විට ගැටලු සහගත වී ඇති බවයි. එබැවින් සුභසාධන සේවාවන් පුළුල්ව සිදුවන බවක් දක්නට නොලැබේ. අධ්‍යයනයට යොදා ගත් ගැහැණු ළමුන් 10 දෙනා වෙන් වෙන්ව ගෙන බැලීමේදී ඔවුන් සඳහා සමාන සේවාවන් මෙන්ම එකිනෙකාට වෙනස් වූ සුවිශේෂී සේවාවන් රැසක් ක්‍රියාත්මක කළ යුතුව පවති. එහෙත් ඇතැම් සම්පත්වල සීමාවන් හේතුවෙන් ළමුන් වෙත ලැබිය යුතු සුභසාධන සේවාවන් විධිමත්ව නොලැබෙන බව මෙම පරීක්ෂණයේදී අනාවරණය විය.

මීට අමතරව සමාජ සහයෝගය විධිමත්ව නොලැබීම, ජාතික ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම
ළමා අයිතිවාසිකම් පිළිබඳ ළමාරක්ෂණ නිලධාරීන්ගේ අඩුසැළකිල්ල, ළමුන්ගේ සමාජානුයෝජනයෙහි ගැටළු

සහ විකල්ප රැකවරණය පිළිබඳ විධිමත් නියාමනයක් නොමැතිකම යනාදී අභියෝගයන්ද මෙම ප්‍රතිචාරකයින්ගේ උපරිම යහපත කෙරෙහි බලපා ඇති බව මෙම අධ්‍යයනය තුළ දී නිරීක්ෂණය විය.

මේ ආකාරයට ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ළමුන්ගේ උපරිම යහපත කෙරෙහි අභියෝග හා බාධක රාශියක් පවතින බව අධ්‍යයනය තුළදී තහවුරු වී තිබේ.

**4.6. ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා මනෝ සමාජීය මැදිහත්කරණයෙහි අවශ්‍යතාවය**

එක්සත්ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ පැහැදිලිව සඳහන් වන්නේ ළමයින් අයථා ලිංගික සබදතා ඇතුළු අයථා ක්‍රියාවන්ට භාජනය කිරීමෙන් ළමයා ආරක්ෂා කර ගැනීම සඳහා පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සියලුම යෝග්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජීය සහ අධ්‍යාපනික පියවරයන් ගනු ලැබිය යුතු බවත් එම ආරක්ෂක වැඩ පිළිවෙලට ළමයාට සහ ළමයාගේ ආරක්ෂක රැකවරණය දරණ තැනැත්තන්ට අවශ්‍ය ආධාරය සලසන්නා වූ සමාජ වැඩ පිළිවෙලවල් පිහිටුවීම සඳහාද යෝග්‍ය වන්නා වූ වෙනත් ස්වභාවයේ ඵලදායී කාර්ය පටිපාටි ඇතුළත් විය යුතු බවයි. මනෝ සමාජීය මැදිහත්කරණය මගින් පුද්ගලයන්ගේ පෞද්ගලික තෘප්තිය සහ ස්වාධීනත්වය සමාජමය තෘප්තිමත්භාවය හා ස්වාධීනත්වයක් ගොඩනැගීමට උපකාර කරනු ලබයි. එසේම මනෝ සමාජීය මැදිහත්කරණය මගින් පුද්ගලයා කරා පැන නගින නොයෙක් සමාජ ගැටලු විසඳීම හා පුද්ගල සංවර්ධනය ගොඩනැගීම සඳහා අවශ්‍ය සවිබල ගැන්වීම් සිදුවේ.එතුළින් පුද්ගලයින්ගේ ජීවිතවලට බලපාන විවිධාකාර අභියෝගයන්ට මුහුණ දීමට හා පුද්ගල යහපැවැත්ම වර්ධනය කිරීම සඳහා කටයුතු කරනු ලබයි.

මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වූ කාරණා පිළිබඳව ගැඹුරින් අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැක්කේ ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේදී මනෝ සමාජීය මැදිහත් වීමක් කඩිනමින් සිදුවිය යුතු බවයි. එහිදී මෙම පර්යේෂණය තුළදී හඳුනාගත් උපරිම යහපත සඳහා පවතින අභියෝග හා බාධක ආමන්ත්‍රණය කළ යුතුව ඇත.

සියදිවි නසා ගැනීමේ සිතුවිලි සමගින් කල්ගෙවන නිම්නා දැරිය,ඇබ්බැහිකාරී තත්වයට පත් ව ඇති නදී දැරිය,දැඩි කලකිරීමෙන් පසුවන ටානියා දැරිය මෙන්ම මානසික ප්‍රතිකාර සඳහා යොමු වී සිටින සුපුනි දැරිය යන ගැහැණු ළමුන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔවුන් සියලු දෙනා සඳහා මනෝ සමාජීය මැදිහත්කරණයක් කඩිනමින් අවශ්‍ය බව පෙනේ. එහිදී ප්‍රථමයෙන්ම ඔවුන්ගේ ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත් විය යුතු අතර අනතුරුව සංවර්ධනය හා යහපැවැත්ම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. අනතුරුව ඔවුන්ගේ පුනරුත්ථාපනය හා සුභසාධනය සඳහා ද මනෝ සමාජීය මැදිහත්කරණය යොදා ගත යුතුය.

මීට අමතරව අනෙකුත් ළමුන්ගේ උපරිම යහපත සඳහාද මනෝ සමාජීය මැදිහත්කරණය අවශ්‍ය වී තිබේ.එහිදී ඔවුන්ගේ සංවර්ධනයට මෙන්ම ආරක්ෂාව, යහපැවැත්ම හා සුභසාධනයට මනෝ සමාජීය මැදිහත්කරණය අත්‍යවශ්‍ය වේ.

**5. නිගමන**

මෙම පර්යේෂණයේදී ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන නවයොවුන් වියේ ගැහැණු ළමුන්, ඔවුන්ගේ භාරකරුවන් හා ඔවුන් පිළිබඳ අධීක්ෂණය කරනු ලබන පරිවාස නිලධාරීන් යන ප්‍රතිචාරකයින් ලබා දුන් මූලික දත්ත හා ළමාරක්ෂණ නිලධාරියෙකු ලෙස පර්යේෂකයාගේ අත්දැකීම් මෙන්ම ද්විතික දත්ත උපයෝගී කර ගනිමින් ගුණාත්මක විශ්ලේෂණයක් ඔස්සේ සිදු කරන ලද අතර පර්යේෂණයෙන් හදුනාගත් තොරතුරු ඇසුරින් පහත සදහන් නිගමන ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව

1 අධ්‍යයනයට ලක් වූ ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ පවුල් පසුබිම ඔවුන් ලිංගික අපයෝජනයට ගොදුරු වීමෙහිලා ප්‍රබල බලපෑමක් එල්ල කොට ඇත. සමාජයේ මූලික ඒකකය වන පවුල තුළ ළමයෙකුට හිමිවිය යුතු රැකවරණය නිසිලෙස නොලැබීම තුළ ඔවුන් බහුතරයක් මෙසේ ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ. ප්‍රතිචාරකයින්ගේ බහුතරයක් පවුල් බිඳුණු පවුල් පසුබිමකින් යුක්ත වේ. ඒ හේතුවෙන් මෙම ගැහැණු ළමුන්ගේ සමාජානුයෝජනය අහිතකර ආකාරයට සිදු වීමෙන් ළමා සංවර්ධනයට බාධක පැමිණ තිබේ. එහිදී ළමුන්ගේ ආරක්ෂාවට ප්‍රබල බලපෑමක් එල්ල වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස නව යොවුන් වියේදී ඔවුන් ලිංගික අපයෝජනයට ගොදුරු වී තිබේ.

2 ප්‍රතිචාරකයින් බහුතරයක් සිංහල බෞද්ධ වේ. අධ්‍යයනය සඳහා යොදාගත් ප්‍රතිචාරකයින්ගෙන් එක් ප්‍රතිචාරකයෙක් පමණක් කතෝලික ආගමට අයත් විය. මොවුන් සියලුම දෙනා ග්‍රාමීය සංස්කෘතියක හැදී වැඩී ඇත.

3 මොවුන්ගේ අධ්‍යයන පසුබිම පිළිබඳව හදුනාගත හැක්කේ 08 ක් 09 ශ්‍රේණිය හෝ 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා ඇති බවයි. අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනයට යොමු වී ඇත්තේ ප්‍රතිචාරකයින් එක් අයෙකු පමණි.

4 ප්‍රතිචාරකයින්ගේ ආර්ථික පසුබිම පිළිබඳ හදුනාගත හැක්කේ වැඩි දෙනෙක් අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජිකයන් බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මව හෝ පියා විදේශගතවීමෙන් ළමුන් අනාරක්ෂිත වීමක් සිදු වී ඇත.

5 ප්‍රතිචාරකයින් ගොදුරු වී ඇති ලිංගික අපයෝජනයෙහි ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී නියැදීන් 08 ක් ස්ත්‍රී දූෂණය සදහා ගොදුරු වී තිබේ. ස්ත්‍රී දූෂණයට ගොදුරු වූ ගැහැණු ළමුන් තිදෙනෙකු ළමා මව්වරු බවට පත්ව ඇත. තිබේ. එක් සිද්ධියකදී පමණක් අශ්ශීල ආකාරයේ ප්‍රදර්ශනයක් මගින් ගැහැණු ළමයෙකු ලිංගික

අපයෝජනයට ගොදුරු වී තිබේ. ස්ත්‍රී දූෂණයට ගොදුරු වූ ළමුන්ගෙන් බහුතරයක් අඩුවයසින් ප්‍රේම සම්බන්ධතා වලට යොමු වී එය කැමැත්තෙන් ලිංගික අපයෝජනයට ගොදුරු වී ඇත. එක් ස්ත්‍රී දූෂණ සිදුවීමක් බලහත්කාරයෙන් සිදු වී තිබෙන අතර සියලුම ස්ත්‍රී දූෂණ වැරදි ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයට අයත් වන බව නිගමනය වේ. තවද එක් සිද්ධියක් දණ්ඩ නීති සංග්‍රහයෙහි ව්‍යභිචාරය වරදට අයත් වන බව හඳුනා ගත හැකි වුවද පොලිසිය නඩු පවරා ඇත්තේ ස්ත්‍රී දූෂණ වරදටය.

6 ප්‍රතිචාරකයින් සියලුම දෙනා විකල්ප රැකවරණයට යොමුකොට ඇත්තේ විධිමත් ආකාරයේ අධිකරණ තීන්දුවක් මගිනි. මොවුන් සියලුම දෙනා ප්‍රජාපාදක විකල්ප රැකවරණයේ පසුවේ. ඉන් 04ක් සුදුසු පුද්ගල පරිලෝචන නියෝගයක් මත ඥාතීන් වන සුදුසු පුද්ගලයන් වෙත ලබා දී තිබේ. දෙමාපියන් වෙත ලබා දී ඇති දරුවන් පරිලෝචන නියෝගයක් මගින් ඔවුන් වෙත භාර දී තිබේ. සුදුසු පුද්ගල පරිලෝචන නියෝග මෙන්ම පරිලෝචන නියෝග මාස 06, අවුරුද්ද, අවුරුදු 02 හා අවුරුදු 03 යනාදී ලෙස ලබා දී ඇත. ළමයින් සහ යෞවනයන් පිළිබඳ ආඥාපනත (1939) අනුව ළමයෙකු සහ යෞවනයෙකු සඳහා ඉහත නියෝග පැනවීමට අධිකරණයට බලය තිබේ. එහෙත් වයස අවුරුදු 16 සම්පූර්ණ වූ පසු එවැනි නියෝගයක් පැනවීමට ළමයින් හා යෞවනයින් පිළිබද ආඥා පනතට අනුව අධිකරණයට හැකියාවක් නොමැත.

7 මෙම ළමුන්ගේ උපරිම යහපත සිදුවන ආකාරය පිළිබඳ පරීක්ෂා කිරීමේදී හඳුනාගත හැකිවූයේ සියලුම ළමුන්ගේ උපරිම යහපත නිසි ආකාරයෙන් සිදු නොවන බවයි. ඔවුන්ගේ සංවර්ධනයට, ආරක්ෂාවට, යහපැවැත්මට, ශුභසාධනයට හා පුනරුත්ථාපනය නිසි ලෙස සිදුනොවන බව නිරීක්ෂණය විය. ඒ සඳහා සාධක ගණනාවක් බලපා තිබේ. මෙම ළමුන්ට එක්සත් ජාතීන්ගේ සංවිධානය 1989 දී සම්මත කළ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ සඳහන් ළමා අයිතිවාසිකම් රාශියක් උල්ලංඝනය වී ඇත. එහි සඳහන් ප්‍රධානතම මූලධර්මයක් වන උපරිම යහපත පිළිබඳ මූලධර්මය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන බව මෙහිදී හඳුනාගත හැකි විය.

9 ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමේ දී මනෝ සමාජීය මැදිහත්කරණය අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකිය.

## 6. යෝජනා

ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත සඳහා මනෝ සමාජීය මැදිහත්කරණයෙහි අවශ්‍යතාවය සොයා බැලීම සඳහා සිදුකරන

ලද මෙම පර්යේෂණයේදී අනාවරණය වූ කරුණු පදනම් කොට ගනිමින් පහත සඳහන් යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව

- ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයට යොමු වන ගැහැණු ළමුන්ගේ උපරිම යහපත උදෙසා පරිවාස කාර්යාලවලට උපදේශන නිලධාරියෙකුගේ සේවය අත්‍යාවශ්‍ය වී තිබේ. වර්තමාන පරිවාස කාර්යාල වල සේවය කරන සංවර්ධන නිලධාරියෙකු හෝ පුහුණු කොට ඒ සඳහා යෙදවීමට ශක්‍යතාවක් තිබේ නම් එම වෘත්තිකයා මගින් ළමුන්ගේ උපරිම යහපත උදෙසා සක්‍රීය මනෝ සමාජීය මැදිහත්කරණයක් සිදු කිරීමට අවස්ථාව සැලසේ.
- පරිවාස දෙපාර්තමේන්තුව ළමුන්ගේ උපරිම යහපත පිළිබඳව දක්වන සැලකිලිමත්භාවය මීටත් වඩා වැඩි කළ යුතුය. විශේෂයෙන්ම ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ සිටින මෙම ළමුන්ගේ සංවර්ධනය, ආරක්ෂාව, යහපැවැත්ම, සුභසාධනය හා පුනරුත්ථාපනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කොට එම අංශ ඔස්සේ ළමුන්ගේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමට පෙළඹිය යුතුය.
- ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ පසුවන ළමුන් පිළිබඳව දත්ත පද්ධතියක් හැකි ඉක්මනින් සකස් කොට එම ළමුන් පිළිබඳව වඩාත් සාර්ථක තක්සේරුකරණයක් සිදුකිරීමට උත්සාහ ගත යුතුය.
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥාප්තියේ සඳහන් පරිදි අවුරුදු 18 ට අඩු වයස් කාණ්ඩයේ ළමයින් වේ. පරිලෝචන නියෝග හෝ සුදුසු පුද්ගල පරිලෝචන නියෝග ලබාගත හැක්කේ වයස අවුරුදු 16 ට අඩු ළමුන් සඳහා පමණි. එහෙත් සමහර ළමුන් වයස අවුරුදු 17ත් 18ත් දක්වා විකල්ප රැකවරණයේ පසුවේ. ඔවුන් පිළිබඳව නීත්‍යානුකූල පදනමින් විධිමත් අධීක්ෂණයක් සිදුකිරීම සඳහා ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතට සංශෝධන ඉදිරිපත් කළ යුතුව ඇත.
- ලිංගික අපයෝජනයට ලක්වී විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ යහපැවැත්ම උදෙසා මනෝ සමාජීය මැදිහත්කරණයේදී බහුවිධ අංශ වල සහයෝගය ලබාගැනීමට කටයුතු කළ යුතුය.
- උපරිම යහපත සංකල්පය වඩාත් හොඳින් අර්ථකථනය කර ගනිමින් පරිවාස නිලධාරීන්, ස්ථානභාර පරිවාස නිලධාරීන් සඳහා මෙන්ම සංවර්ධන නිලධාරීන් සඳහා ද සමාජ වැඩ වෘත්තීය පුහුණුවක් ලබාදීමට කටයුතු කළ යුතුය.
- ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලාංකික දරුවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික මාර්ගෝපදේශනය හා ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවමින් ලිංගික අපයෝජනයට ගොදුරු වී විකල්ප රැකවරණයේ සිටින ගැහැණු ළමුන්ගේ උපරිම යහපත උදෙසා අවශ්‍ය මැදිහත්කරණය සිදු කිරීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානයක් යොමු විය යුතුය.
- ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් බිහිකරනු ලබන සමාජ වැඩ වෘත්තිකයින්ගේ සේවය මෙම ළමුන්ගේ උපරිම යහපත උදෙසා ඵලදායීව යොදා ගැනීමට ක්‍රියා කිරීම වැදගත් වේ. ඒ අනුව සමාජ වැඩ ඩිප්ලෝමා අපේක්ෂකයින්, උපාධි අපේක්ෂකයින් මෙන්ම ශාස්ත්‍රපති උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ ක්ෂේත්‍ර පුහුණුව සඳහා අනුයුක්ත කිරීමේදී පරිවාස කාර්යාල වෙත අනුයුක්ත කොට මෙවැනි ළමුන්ගේ උපරිම යහපත උදෙසා අවශ්‍ය මනෝ සමාජීය මැදිහත්කරණය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවයකි.

**References**

Cohen, J. A., Deblinger, E., Mannarino, A. Trauma-Focused Cognitive-Behavioral Therapy (TF-CBT) for children who have experienced sexual abuse. (Clinical literature & reviews).

Department of Probation and Child Care Services / UNICEF Sri Lanka. Situational analyses and sector budget briefs (child care institutions and child protection).

National Alternative Care Policy for Children in Sri Lanka — Ministry of Women and Child Affairs. (Official policy document).

UNICEF & IRC. Caring for Child Survivors of Sexual Abuse (CCS) — Guidelines. (2012; updated resources 2021).

UNICEF. Communities Care — Psychosocial Training Guide for response to sexual violence.